# ශ්‍රී ලංකාවේ පැරණි උද්‍යාන කලාව

ලංකා දර්ශනී ද සිල්වා

Garden Design is a prominent and popular decorative process in architectural and landscape planning in the world. Different cultures and traditions integrated different characteristics to their systems depending on their particular nature: royal, religious or entertainment etc. Sri Lanka, too, provides evidence of widespread garden designing experience through its long history for which the examples and indications can be found in chronicles and archaeological evidence for us to witness. The significance of such landscape is the particular space and the elements that the designers utilized to demonstrate the defined situation and the necessity. However, an overall examination of the Sri Lankan landscape design provided an inclination of happiness and pleasure to the people and the community that sustained it. Thus, this paper elaborates the particular innovations in Sri Lankan garden design and its characteristics.

උද්‍යාන නිර්මාණය වූ කලී විශ්ව කලාවකි. සොබාදහම වැනි චංචල වූ ද, කැලඹෙන සුලු වූ ද, අපූර්වතම වූවකට කිසියම් පිළිවෙලක් ඇති කිරීමට උද්‍යාන නිර්මාණයෙන් හැකි විය. මෙය සංකීර්ණ ක්‍රියාවලියකි. මානව ශිෂ්ටාචාරයේ ආරම්භය තරමට ම මෙහි ඉතිහාසය පැරණි ය. පරිසරය තමාට ඇවැසි පරිදි අවනත කර ගැනීමෙහි ලා මිනිසා පෙළඹීමේ පළමු පියවර උද්‍යාන නිර්මාණ සංකල්පය මානව ශිෂ්ටාචාරයට එක් කිරීමට සමත් විය. මෙම වැදගත් ක්‍රියාදාමය පිළිබඳ ව ඓතිහාසික ස්මාරක හා වැඩබිම් පිළිබඳ අන්තර්ජාතික කමිටුව (ICOMOS) 1981 වර්ෂයේ දී ෆ්ලෝරන්ස් හි නිකුත් කළ ආඥා පත්‍රයේ මෙසේ සඳහන් වේ.

---

© ලංකා දර්ශනී ද සිල්වා

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13,** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

> ''උද්‍යාන ශිෂ්ටාචාරය සහ සොබාදහම අතර ඍජු සම්බන්ධතාව ප්‍රකාශ කිරීමක් ලෙස ද, භාවනා කිරීමට හෝ සන්සුන්තාවට සුදුසු ප්‍රදේශයක් ලෙස ද, ලෝකය පිළිබඳ පරමාදර්ශී ප්‍රතිබිම්බයක විශ්ව වැදගත්කමක් ගන්නේ ය. පදයේ නිරුක්ති අර්ථය අනුව එය පාරාදීසයක් වුව ද, සංස්කෘතියකට, ශෛලියකට, යුගයකට එය සාක්ෂි දරයි. එය බොහෝ විට නිර්මාණාත්මක කලාකරුවකුගේ නිර්මාණ ශක්තිය ද විදහා දක්වයි.''[1]

මිනිසා සිය පෞද්ගලික අවශ්‍යතාවනට අනුකූල ව අවට පරිසරය සකසා ගැනීමේ ප්‍රයත්නයේ ආදිතම සටහන යුප්‍රටීස් සහ ටයිග්‍රිස් ගංගා නිම්නයේ මුල් ම ශිෂ්ටාචාර ගොඩනැගූවන් විසින් සනිටුහන් කරන ලදි. එතැන් සිට ලෝක ඉතිහාසයෙහි විවිධ කාල පරිච්ඡේදයන් හි විසූ පාලකයෝ සිය මාළිගාවන් හි අවට අලංකරණයත්, සිය බලය ප්‍රකාශ කිරීමත් උදෙසා උද්‍යාන විශිෂ්ට අයුරින් නිර්මාණය කිරීමට පෙළඹුනහ. මෙම ඓතිහාසික අවස්ථාවන් ඉතිහාසඥයන් විසින් සිය වාර්තාවන් හි වරින් වර සටහන් කර තිබේ. සුමේරියානු, පර්සියානු, මිසර, ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවල සේ ම මධ්‍යකාලීන යුගයේ සිට 19 වන සියවස දක්වා මෑත පෙරදිග හා යුරෝපයේ කලා ඉතිහාසය පුරා මෙම ස්වභාවය ප්‍රතීයමාන වේ.

උද්‍යාන කලා විෂයෙහි මෙම දීර්ඝකාලීන වෘත්තාන්තය අපරදිග ලෝකයට පමණක් සීමා නොවී ය. දකුණු ආසියාව, අග්නිදිග ආසියාව සහ ඈත පෙරදිග රටවල් ද බෙහෙවින් පොහොසත් වූ උද්‍යාන කලා සම්ප්‍රදායකට හිමිකම් කීම වැදගත් ය. මින් බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගත කරුණුවලට අනුව බුද්ධ කාලීන භාරතයේ උද්‍යාන කලාවක් පැවති බවට සනාථ කළ හැකි සාධක ද හමු වේ. පුරාණ දඹදිව පිහිටි සොළොස් මහා ජනපදවල විවිධ නම්වලින් හඳුන්වනු ලැබූ උයන් ප්‍රකට ව පැවති බව බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. වේලුවනාරාමය, ජේතවනාරාමය, පාවාරික අඹ වනය, මල්ල රජදරුවන්ගේ උපවත්තන සල් උයන, සෝෂිතාරාමය සහ ලුම්බිණි සල් උයන නිදසුන් සේ දැක්විය හැකි ය. එසේ ම සංස්කෘත ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයක් වන **උපවන විනෝදය** උද්‍යාන නිර්මාණ සැලසුම්කරණය සම්බන්ධයෙන් මෙන් ම නාගරික සැලසුම්කරණය සම්බන්ධයෙන් රචනා වී ඇති පැරණි ග්‍රන්ථයක් වේ. සියවස් ගණනක් පුරා භාරතයේ උද්‍යාන කලාවක් පැවතිය ද, එය

වඩාත් විශිෂ්ටත්වයට පත් කළේ මෝසුල්වරු ය. පෙරදිග පැරණි උද්‍යාන කලාව භාරතයට පමණක් සීමා නොවී ය. චීනයේ පෞරාණික උද්‍යාන කලා සම්ප්‍රදාය ක්‍රි. පූ. 2000 තරම් ඉපැරණි අවධියකට අයත් ය. එතරම් ම පැරණි යුගයකට අයත් නොවූව ද විශිෂ්ට ගණයේ උද්‍යාන කලා සම්ප්‍රදායකට උරුම කීමට ජපානයට හැකි ව තිබේ. කොරියාව ද පෙරදිග උද්‍යාන නිර්මාණය සම්බන්ධ ව ප්‍රබල සම්ප්‍රදායක අනන්‍යතාව ප්‍රකට කරන රටකි.

මෙම පෞරාණික කලා සම්ප්‍රදාය පිළිබඳ ව ශ්‍රී ලංකාවේ අනාවරණය වන ඓතිහාසික සාධක ක්‍රි. පූ. අවධිය තරම් ම පැරණි වීම විශේෂයකි. විජය රජුට පෙර වූ මහානාග වනෝද්‍යානය නම් උයනක් පිළිබඳ ව **මහාවංසයේ** සඳහන් වේ.

> "ලඞ්කාවීප මධ්‍යයෙහි මනොරම්‍ය වූ ගංඉවුරෙහි තුන් යොදුන් දිගු එක් යොදුන් පුළුල් වූ රම්‍ය වූ මහානාගවන නම් උයනෙහි යක්ෂයන්ගේ යුධභූමියෙහි ලක්දිව වැසි යකුන්ගේ මහානීසාචර සමාගමය ප්‍රසිද්ධ ම ය."[2]

ක්‍රි. පූ. 4 වන සිවසේ දී පණ්ඩුකාභය රජු වලවාමුඛී නම් යකින්න වෙනුවෙන් සිය ගෙළුයනෙහි දේවාලයක් ඉදිකර එහි වැඩ විසීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන ලද්දේ තමනට කළ උදව් උපකාර වෙනුවෙන් බව ද වංසකථා තව දුරටත් සඳහන් කරයි.

> "යක්ෂයොනියෙහි උපන්නාවූ පූර්වෝපකාරී ඒ දාසිය නුවර දකුණු දිග් දොර කෙළෙහිගුණ දන්නා ඒ තෙම වාසය කරවී. වළවාමුඛ යකිනි රජගෙවුයන් ඇතුලත වැස්වී. උන්ටද අන්‍යයයන්ට ද අවුරුදු පතා බලිදානය කරවී."[3]

මෙසේ ශ්‍රී ලංකාවේ පැරණි උද්‍යාන කලාව පිළිබඳ ව බොහෝ තොරතුරු වංසකථා මෙන් ම විවිධ සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින් සම්පාදනය කර ගැනීමට හැකි ව තිබේ. **මහාවංසය, චූලවංසය, දීපවංසය, මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ** සේ ම **සංදේශ කාව්‍යය** ද මෙහි ලා වැදගත් වේ. තව ද, අනුරාධපුරය රාජධානියක් බවට පත් වූ පසු පණ්ඩුකාභය රජුගේ පුත් මුඨසීව රජු ක්‍රි. පූ. 250 දී පමණ මහාමේඝ උද්‍යානය කර වූ බව **මහාවංසයේ** මෙන් ම **දීපවංසයේ** ද සඳහන් වේ.

> " ඒ රජු ඇවෑමෙන් ස්වර්ණපාලී බිසවුන් පිත් එම රජුට දාවූ මුටසීවයයි ප්‍රසිද්ධ කුමර නිරාකුල රජයට පැමිණියේය. ඒ රජ තෙමේ පලමල් තුරින් හොබනා මහාමේඝ වනොද්‍යාන නම් වූ අනූන ගුණයෙන් යුක්ත යහපත් උයන් කරවීය. උයන් බිම් ගන්නා දවස නොකල් මහවැස්සෙක් වටුයේය , එහෙයින් ඒ උයන මහාමේඝවන නම් වී, මුටසීව රජ තෙමේ ලඞ්කා මහී කාන්තාවගේ මුහුණුබඳු යහපත් පුරශ්‍රේෂ්ඨ වූ අනුරාධපුරයෙහි සැටවසක් රජය කළේයි."[4]

මහාවංශයේ අපූර්ව විවරණයකට අනුව කකුසඳ සර්වඥයන් වැඩසිටි සමයේ මෙම මහාමෙව්නා උයන මහාතීර්ථ නම් විය.

> "මේ කල්පයෙහි පළමු වෙනුව සියලු ධර්මයන් දත්තාවූ සියලු ලෝකයට අනු කම්පාකර වූ ශාස්තෘ වූ කකුසඳ නම් සර්වඥයෙක් වූ සේක. (එකල) මේ මහාමෙව්නා උයන මහාතීර්ථ නම් විය. මෙහිම පසු බත්කල්හි වැඩහුන්නාවූ සර්වඥයන්වහන්සේට ඒ මහාතීර්ථ නම් වූ උයන ඒ රජ තෙම උතුම් වූ දක්ෂිණා කොට දුන්නේය. එකල අකාල පුෂ්පයෙන් අලඞ්කෘත මහාතීර්ථ නම් වූ උයන සර්වඥයන්වහන්සේ විසින් පිළිගත් කල්හි මහාපොළොව කම්පිත විය."[5]

දේවානම්පියතිස්ස රජ දවස මිහිඳු හිමි ප්‍රමුඛ මහා සංඝයාට පූජා කරන ලද්දේ මෙම උද්‍යානය ම බව සැලකේ. මෙම අවධියේ ම, එනම් ක්‍රි. පූ. 3 වන සියවසේ දී අනුරාධපුරය ආශ්‍රිත ව තවත් උද්‍යාන නිර්මාණය විය. මහාවංසයේ සඳහන් වන පරිදි අනුරාධපුර නගරයෙහි දක්ෂිණ ද්වාරය ආසන්නයෙහි රජ මාළිගාවට නුදුරින් පිහිටි නන්දන වනෝද්‍යානය මින් ප්‍රකට ය.

> "එහි පැමිණි ආදර සහිතවූ ඒ මනුෂ්‍යයෝ ඇත්හලද අනව කාසයයි නුවර දකුණු දොරින් පිට ශාන්ද්‍රච්ඡායා ඇති නිල් කුශතණින් යුක්ත වූ සිහිල් මනරම් වූ නන්දන නම් රජ උයනෙහි තෙරුන්වහන්සේලාට අසුන් පැණවූහ. ස්ථවිරතෙම (නුවර) දකුණු දොරින් නික්ම එහිද වැඩහුන්සේක, ශ්‍රේෂ්ඨ කුලවත් වූ බොහෝ ස්ත්‍රීහු ද එහි අවුත් උයන පුරවමින් තෙරුවන් වහන්සේට නුදුරුව උන්හ. ස්ථවිරතෙම ඔවුනට බාලපණ්ඩිත නම් සුත්‍රාන්තධර්මය දේශනා කළ සේක. ඔවුන්

> අතුරෙන් දහසක් ස්ත්‍රීහු පළමුවෙනිවූ සොවාන් ඵලයට පැමිණියහ. මෙසේ ඒ නන්දන නම් උයනෙහිම සවස් වේලාව වූයේය."[6]

තවද, විජයරාමය නම් තවත් උද්‍යානයක් පිළිබඳ ව මහාබෝධිවංසයෙහි විස්තර වේ.[7] එසේ ම, වසභ රජ අනුරාධපුරය අලංකරණය කිරීමේ දී උයන් හී කෘත්‍රිම ජලාශ තැනීමට අදහස් කළ බව ද වංසකථා දක්වයි.

පැරණි සිංහල රජවරු සිය රාජධානිවල විවිධ ස්ථානයන්හි තුරුලියෙන්, මලින් පිරි උයන් වතු තැනූ බව සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින් අනාවරණය වේ. එපමණක් නොව, දකුණු ආසියාතික රටවල කලා ඉතිහාසය අධ්‍යයනයේ දී ගෘහ නිර්මාණ කලාව, චිත්‍ර කලාව මෙන් ම සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින් එම රටවල ජලය හා සම්බන්ධ උත්සව, ජල ක්‍රීඩා මෙන් ම ජල උද්‍යාන හා සබැඳි පැරණි උසස් ජීවන රටාවක් පැවති බවට සාධක හමු වේ. අතීතයේ දී ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන රටාව කෘෂිකාර්මික ශිෂ්ටාචාරයක් වටා ගොඩනැගුණු අතර ඊට ප්‍රධාන වශයෙන් ජලය සේ ම වාරිමාර්ග විධික්‍රම රටාවන් ද බලපාන ලද බව පෙනේ. නිරන්තරයෙන් ම මීට සශ්‍රීකත්වය හා බැඳුණු විවිධ අභිචාර විධීන් ද සම්බන්ධ විය. මේ පිළිබඳ ව අදහස් පළ කරන චාල්ස් ගොඩකුඹුරේ මහතා ලාංකික ජන සමාජයේ සශ්‍රීකත්වය හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර හා ජල ක්‍රීඩා සම්බන්ධ ව ද පැවති බව පවසයි. [8]

උයන් වතුකරණය ශ්‍රී ලාංකික රජවරුන්ගේ විශේෂ අවධානයට හා සැලකිල්ලට පාත්‍ර වූ ක්ෂෙත්‍රයක් විය. ඔවුහු වටිනා දැව, දුර්ලභ ඖෂධ වර්ග මෙන් ම නොයෙක් අවශ්‍යතාවන් උදෙසා විවිධ පැළ වර්ග උයන් වතු ආශ්‍රිත ව රෝපණය කිරීමෙන් උද්භිද උද්‍යාන නිර්මාණකරණයට දායක වූහ. ලංකා ඉතිහාසයෙහි මෙම කර්තව්‍යයෙහි ලා විශිෂ්ටත්වයට පත් රජවරු කිහිප දෙනෙකි. පැරණි රාජකීය උයන් අතුරින් අනුරාධපුරයෙහි රන්මසු උයන වැඩි පෞරාණිකත්වයකින් යුත් උයන වේ. ලංකාවේ උද්‍යාන පිළිබඳ ව වංසකථාවලට අමතර ව ශිලා ලේඛනවල ද යම් ප්‍රමාණයක තොරතුරු අන්තර්ගත ය. මෙහි ලා IV වන මිහිඳු රජ විසින්

ඉස්සරසමණ විහාරයෙහි නිකුත් කරන ලද රාජ ආඥාව සඳහන් සෙල් ලිපිය වැදගත් වේ. එහි සඳහන් වන පරිදි තිසාවැවෙන් නිකුත් කරන ජලය එහි පිහිටියා වූ උයනක ජල පොකුණුවලට ද, ඉස්සරසමණ විහාරයට අයත් කුඹුරුවලට ද යැවිය යුතු ය.[9] තිසාවැව අසල පිහිටි මෙම උයන රන්මසු උයන වන අතර මෙය පැරණි සිංහල රජවරුන්ගේ මගුල් උයන ව පැවති බවට සාධක හමු වේ. නමුදු මෙහි නිර්මාතෘ කවරෙක් දැයි යන්න අප්‍රකට ය. සෙනරත් පරණවිතානයන් අදහස් කරන පරිදි දුටුගැමුණු රජ දවස මෙම ස්ථානය මගුල් උයනක් ව පැවතී ඇත.

රන්මසු උයනෙහි නෂ්ටාවශේෂ අතුරින් වර්තමානයේ දිස්වන වැදගත් ම අංගය නම් ස්වභාවික ගල්කුලු හා බැඳි ව නිර්මාණය වූ පොකුණු හා ඊට අයත් වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් ය. රන්මසු උයනෙහි ජල තාක්ෂණ රටාව ක්‍රි. ව. 9-10 සියවස්වලට අයත් බව මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා අදහස් කරයි.[10] උද්‍යානයේ ජල මාර්ග පද්ධතිය ඉතා සංකීර්ණ ස්වභාවයක් ගනී. පොකුණුවලට සම්බන්ධ ජල මාර්ගවලට අමතර ව උද්‍යාන භූමිය පුරා විසිරී ගිය ජල මාර්ග සැකැස්මකි. එම ජල මාර්ග පද්ධතිය පොකුණුවලින් පරිබාහිර ව නිර්මාණය වූවකි. උද්‍යානයේ සමස්ත සැලසුම්කරණය කෙරෙහි අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ උසස් තාක්ෂණික භාවිතයක් මෙන් ම අපූර්ව කලාත්මක භාවිතයක් ප්‍රකට වන අයුරින් එය නිමවා ඇති බව ය.

රාජකීය උද්‍යාන නිර්මාණයේ වඩාත් සුවිශේෂී අවස්ථාවක් විදහා දක්වන්නේ සීගිරි රාජකීය උද්‍යානයයි. ක්‍රිස්තු වර්ෂයෙන් 5 වන සියවසේ දී පමණ සීගිරි කාශ්‍යප විසින් ඉදිකරවන ලද අසමසම නිර්මාණයක් සේ සැලකෙන මෙම උද්‍යාන ලොව පැරණි ම නාගරික සංකීර්ණයක පිහිටි උද්‍යාන අලංකරණ සැලසුම් ක්‍රම සහ තාක්ෂණික භාවිතයේ පරිණත භාවය පළ කරන අගනා නිදසුනකි. සීගිරිය ලෝකයේ අගනා කලා නිර්මාණ අතරට එක් වීමට හේතු වූ සාධක ගණනාවකි. ඉන් කේන්ද්‍රීය සාධකයක් වූයේ සීගිරි රාජෝද්‍යානයයි. ලෝක ප්‍රජාවගේ එතරම් අවධානයට පාත්‍ර නොවූව ද ලෝකයේ පැරණිතම සුවිශේෂ හූ සැලසුම්කරණයකින් යුත් උද්‍යාන නිර්මාණයක් ඊට අයත් ය.

ඉපැරණි නාගරික ව්‍යූහයක් තුළ නිර්මිත මෙම රාජකීය උද්‍යානය කලාපීය වශයෙන් මහත් වැදගත්කමක් උසුලන අතර දකුණු ආසියාතික කලාපයේ ප්‍රබල උද්‍යාන කලා සම්ප්‍රදායක උරුමය ප්‍රකට කරයි. සීගිරි නාගරික ව්‍යූහයත්, එහි අන්තර්ගත උද්‍යාන සැලසුමත් නිර්මිත ස්වභාවය දෘශ්‍යමය අපූර්වත්වයක් පල කරයි. ප්‍රධාන ව පිටත හා ඇතුළත යන පාර්ශව දෙකකින් සැදුම්ලත් නගර සැලසුමෙහි පිටතින් දිය අගලින් වට ව අභ්‍යන්තරයේ වඩාත් සුරක්ෂිත රාජකීය අංගනයේ පිහිටි උද්‍යානවලින් සැදුම් ලත් මාළිගා සංකීර්ණය පැහැදිලි කොටස් තුනකට බෙදී වෙන් ව පවතී. එනම් නැගෙනහිර පෙදෙසෙහි වූ පහත් මාළිගා පෙදෙස, බටහිර පෙදෙසෙහි වූ ඉහළ මාළිගය හා දකුණු දිශාවෙහි වූ මාළිගා උද්‍යාන පෙදෙසයි. උතුරු, දකුණු හා නැගෙනහිර, බටහිරට දිවෙන සම්පූර්ණ සංකීර්ණයේ අක්ෂ මාළිගා පෙදෙසේ දී කේන්ද්‍රය අසල ඡේදනය වේ. මෙම රාජකීය උද්‍යානය පැහැදිලි අන්‍යොන්‍ය සබඳතාවක් පළ කරන ප්‍රධාන උද්‍යාන තුනකින් පරිපූර්ණ ය. එනම් ජල උද්‍යානය, ශෛල උද්‍යානය සහ පර්වතය වටා බැඳි මාලක උද්‍යානයයි.

සීගිරි උද්‍යානයේ සමස්ත සැලසුම ප්‍රධාන අංග දෙකකින් සමන්විත ය. එනම්, සමචතුරස්‍රාකාර වූ බටහිර අංගනය සහ ආයත චතුරස්‍රාකාර වූ නැගෙනහිර අංගනයයි. උද්‍යානයේ සමමිතික ව පිහිටි ප්‍රධාන උද්‍යාන සැලසුම් දෙකකි. ඒවා නගර ප්‍රාකාරයෙන් ද දිය අගලින් ද, ස්වාභාවික භූ සැලසුම්කරණයෙන් ද වට ව පිහිටියේ ය. මෙම රාජකීය උද්‍යානයෙහි වැදගත් ම අංගය නම් සියුම් ජල කළමනාකරණයයි. ජල උද්‍යානය, ශිලා උද්‍යානය, මාලක උද්‍යානය සහ පර්වත මස්තකයෙහි පිහිටි මාළිගා අංගනය යන අංග අතුරින් වඩාත් නිර්මාණශීලී උද්‍යාන සැලසුම බටහිර පාර්ශවයෙහි ජල උද්‍යානයන්ගෙන් නිරූපණය වේ.[11] පොකුණු, ජල මල්, මණ්ඩප, දිය අගල්, පියගැට පෙළ යන උද්‍යාන උපාංගයන් උද්‍යානයේ සමස්ත රිද්මයට අනුගත ව සෞන්දර්යාත්මක හැඟීම් උද්දීපනය වන අයුරින් නිමවා තිබේ.

සමස්ත උද්‍යාන අංගනය විවිධ වූත්, විස්තීර්ණ වූත්, අලංකාර වූත්, සංකීර්ණ වූත් උපාංගයන්ගෙන් සුසැදියේ ය. ජලයෙන් වට වූ දූපත්, කිරිගරුඬ පුවරු අතුරන ලද සර්පාකාර දියඇලි, වෘත්තාකාර

හුණුගල් පියන් සහිත දියමල්, දිය අටලු, ස්නාන මණ්ඩප, දියමංකඩ, දියෙන් වට වූ දූපත්, දූපත් හි නිර්මිත මණ්ඩප, පර්සියානු ආභාසය පල කරන්නා වූ චාර්භාග් සැලසුම සියලු පාරිසරික ප්‍රමිතීන්ට අනුගත ව සොබාදහමට නව්‍ය අත්දැකීමක් එකතු කිරීමට සමත් ව ඇත.

සීගිරිය රාජකීය උයනෙහි ස්වභාවික අලංකාරය තීව්‍ර වනුයේ ස්වභාවික භූමිය මාලක කිහිපයකින් සමන්විත වීමත්, ස්වභාවික ගල් කුළු හා පර්වත භූමිය පුරා විසිරී පැවතීමත් ඒ සියලු දෑ ඒකරාශී ව නිර්මාණය වූ අපූර්ව උද්‍යාන සැලසුම් රටාව මනා රිද්මයකින් ද, සමබරතාවකින් ද, ඒකාග්‍රතාවකින් ද, ත්‍රිමාන රූපී බවකින් ද, අසමාන සෞන්දර්යයකින් ද යුක්ත වීම හේතුවෙනි. ස්වභාවික පිහිට සුවිශාල පර්වතයක් කේන්ද්‍ර කරගනිමින් සංකීර්ණ සැලසුමකින් යුතු ව නිමවා ඇති සීගිරිය රාජකීය උද්‍යානය කලාපීය උද්‍යාන සැලසුම්කරණයන් හි ආභාසය පල කිරීම ද විශේෂ කරුණකි.

රාජකීයයන්ට පමණක් සීමා නොවූ පැරණි ලංකාවේ උද්‍යාන කලාව බෞද්ධ භික්ෂූන් වහන්සේලා වැඩ විසූ ආරාම සංකීර්ණවල ද දක්නට ලැබුණු අනිවාර්ය අංගයක් විය. ආරාමික වාස්තු විද්‍යාවේ එක් පාර්ශවයක් නියෝජනය කරන එය උද්‍යාන සැකැස්ම, භූමි කළමනාකරණය, තාක්ෂණික භාවිතය, ශිල්පීය ප්‍රාගුණ්‍යය පිළිබඳ ප්‍රවීණත්වයක් පළ කරයි. ඓන්ද්‍රිය, පබ්බත, පංචායතන සහ පධානඝර යන විවිධ ආරාම සැලසුම් හි පරිසරයට වඩාත් යෝග්‍ය වූ උද්‍යාන සැලසුම්කරණයක් සූක්ෂම ව හඳුනාගැනීමේ නිසග කුසලතාවක් අතීත උද්‍යාන ශිල්පීන් සතු ව පැවතිණ.

නිල්වන් තුරුලතාවන්ගෙන් සපිරි අපූර්ව උද්භිද විද්‍යාත්මක සංකලනයකින් යුත් රමණීය භූමි භාග අතීතයේ දී ආරාමික භූ සැලසුම්කරණයන්ට නිරතුරුව ම හේතු විය. කළුදිය පොකුණ, රිටිගල, අරංකැලේ, මිහින්තලේ, වෙහෙරබැඳිගල, අනුරාධපුරයේ බටහිර ආරාමය ආදී ආරාම සංකීර්ණවල වැඩ විසූ භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාගේ දෛනික අවශ්‍යතාවයනට ගැළපෙන පරිදි මනා වූ භූ සංරක්ෂණයකින් යුතු ව නිර්මාණය වූ ආරාම සංකීර්ණ ලංකාවේ පැරණි උද්‍යාන කලාවේ විවිධත්වය විදහා පෑ තවත් නිදර්ශනයක් විය. සක්මන් මළු, පියගැට පෙළ සහිත දිගු මංපෙත්, දිය අගලින් වට

වූ ද්විත්ව වේදිකා ගොඩනැගිලි, දියෙන් පිරුණු පොකුණු, ගල් ලෙන්, ස්වාභාවික ව නිර්මාණය වූ මාලක, ආගමික හා ආරාමික ගෘහ නිර්මාණ අංග යන සියලු දෑ ආරාම සංකීර්ණවල උද්‍යාන සැලසුම් හි උපයෝගීතාව මැනවින් ප්‍රකට කරයි. මේවා ඇසුරින් මෙම කලා මාධ්‍යයෙහි භාවිත විධික්‍රම, පරිසරයේ සංවිධිත අවකාශ සැලසුම්කරණය, මනා කළමනාකරණය, ආගමික අවශ්‍යතාව මෙන් ම සෞන්දර්යාත්මක ආකල්ප දෘශ්‍යමාන වීම විශේෂිත ය.

වන ගහනයෙන් යුත් කඳු බෑවුම් සහ අනෙකුත් කඳුවැටිවලින් හුදෙකලාව උතුරුදිග තැනිතලාවේ දසත පැතිරුණු තුරුලතාවන්ගෙන් ගහණ වූ රිටිගල ආරාමය ප්‍රධාන කඳු මුදුන කඳු වළල්ලේ උතුරු වැටියෙන් වෙන් කෙරෙන කඳු අතර මැද පාමුල සොභා සෞන්දර්යයේ අපූර්වත්වය කියාපාමින් පිහිටියේ ය. ක්‍රි. ව. 9 වන සියවසේ I වන සේන රජු විසින් පාංශකූලික භික්ෂූන් අරභයා ඉදිකළ අරිට්ඨ විහාරය නම් වූ රිටිගල පධානඝර වර්ගයට අයත් ආරාම විශේෂයකි. රිටිගල කන්දේ නැගෙනහිර පාර්ශවයේ පිහිටා ඇති ආරාම භූමියේ පළමුව නෙත ගැටෙන දසුන වනුයේ පියගැට පෙළ සහිත සුවිශාල බන්දා පොකුණ ය. මහත් වූ ගල් කුළු, වෘක්ෂලතාදියෙන් ගහණ ද්විත්ව වේදිකාවන්ගෙන් සැදුම්ලත් සොබාදහම හා මානව ක්‍රියාවන්ගේ අපරිමිත වූ සිද්ධි දාමයක විස්වසනීයත්වය ප්‍රකට කරන කදිම නිදර්ශනයක් සේ මෙය දැක්විය හැකි ය.

> ''වම්පස සිට දිවෙන රළු පෙත්මග ආපසු ජල දහරාව දෙසට ගමන් කරයි. ඉවුරේ ප්‍රති විරුද්ධ පාර්ශවයේ ද්විත්ව වේදිකා දෙකකි. මේවා ජල දහරාව මත වු සුවිශාල ගල්කුළු මත ඉදිකර ඇත. මෙම ගොඩනැගිලි දෙකෙහි ම දෙවෙනි වේදිකාවට පහළින් අපූර්ව විහිදීමක් සහිත පදනම් ව්‍යූහ දෙකකි.''[12]

ස්වභාවික පරිසරය වඩාත් සෞන්දර්යාත්මක උපයෝගීතාවකින් යුතු ව භාවිතයට ගනිමින් උද්‍යාන සැලසුම්කරණයක් නිරූපණය වන විශිෂ්ටතම ස්ථානය ලෙස සැලකෙන්නේ මිහින්තලේ කළුදිය පොකුණ ආරාම සංකීර්ණයයි. කළුදිය පොකුණ ආරාම සංකීර්ණය ඇත්වෙහෙර කන්ද හා කළුදිය පොකුණ කඳු ද්විත්වය අතරමැද මිටියාවතෙහි පිහිටි ස්වභාවික පරිසරයේ භෞතික සැකැස්ම

එපරිද්දෙන් ම රැකෙන සේ සමස්තය මනාව සංකලනය කොට නිමවන ලද්දකි. තත්කාලීන ගෘහ නිර්මාණ කලාවත්, පාරිසරික තත්ත්වයත්, උද්‍යාන ශිල්ප තාක්‍ෂණයත් ඇසුරින් මෙම ආරාම සංකීර්ණය සුවිශේෂී ආකාරයට නිර්මාණය කිරීමට හැකි ව තිබේ. ස්වභාවික භූමියේ පිහිටි පාෂාණ පද්ධතිය සහ තුරුලතා ආදියේ සෙවනැලිවලින් ගහන වූ අඳුරු මිටියාවතේ පිහිට කලු පැහැයෙන් යුක්ත ජලාශය මනස්කාන්ත දසුනක අසිරිය මවයි. ලංකාවේ එක ම සංයුක්ත ආරාම ප්‍රභේදය සේ ප්‍රචලිත මහායාන සම්ප්‍රදාය නියෝජනය කරන්නා වු පබ්බත විහාර ගණයට අයත් මෙම ආරාම සංකීර්ණය ආගමික උද්‍යාන කලාවකට විශිෂ්ටතම නිදසුනක් සේ දැක්විය හැකි ය. මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථයේ පළවන පරිදි පබ්බත විහාර ආරාමික භූමිය නිශ්චිත ක්‍රමවේදයකට අනුගත ව සකස් විය යුතු විය.

> ''ආරාම විශේෂය සැලසුම් කරනු ලැබ ඇත්තේ එළිමහන් භූමි භාගෙයක ඉදි කරනු ලැබීම සඳහා ය. එහි ගොඩනැගිලි සංකීර්ණය අඩංගු වු චතුරශ්‍රය ආධාරක පවුරෙක මාර්ගයෙන් නංවන ලද උස් භූමි භාගයක් වූ අතර ඊ වටා ප්‍රදක්ෂිණා පථයක් හා ඊට පිටතින් දිය අගලෙක් ද වී ය. එහි බාහිර සීමාවේ පොල්, පුවක් හෝ උණ ගොමුවෙක් විය. මෙම ආරාම අනුරාධපුරයේ හා පොළොන්නරුවේ දනට නටඹුන් ව පවතින ඇතැම් ආරාම ප්‍රභේද හා මහත් සමානකමක් දක්වයි.''[13]

අනුරාධපුර යුගයේ මධ්‍ය අවධිය වන විට ශ්‍රී ලංකාවේ විශාල උයන්වතු කරවීමට සිංහල රජවරු බොහෝ දෙනෙකුගේ දායකත්වය ලැබිණි. මොවුන් අතුරින් සීගිරි කාශ්‍යප යොදුනක් යොදුනක් පාසා උයන්වතු කර වූ බව වංසකථාවන්හි සඳහන් වේ.

> "හේතෙමේ නුවර දොරටුවල මහවතු කරවි. ලක්දිව්හි යොදනෙන් යොදන අඹ උයන්ද කරවි."[14]

දාඨෝපතිස්ස රජුගේ ඔටුණු නොපළන් මලණුවන් වූ කාශ්‍යප ද මල්වතු, පොල් වතු කරවූ බව ද සඳහන් වේ.

> "මේතෙමේ සත්පුරුෂ සමාගමයෙන් විපිළිසරව 'කළ පාප කර්මයාගේ නාසනය කරණෙමැයි' සිතා මල්වතු පොල්වතු හා වැව්ද කරවි."[15]

එසේ ම V වන සේන රජු ද මෙපරිද්දෙන් ම උයන්වතු නිර්මාණය කළ රජෙකු සේ ඉතිහාසයට එක් වේ. අනුරාධපුර රාජධානිය අවධියේ සේ ම පොළොන්නරු රාජධානි අවධියේ ද උද්‍යාන නිර්මාණය වැදගත් කාර්යයක් වූ බවට සාධක ලැබේ. මෙම උත්කෘෂ්ටවත් මහානිඵල ලත් සත් කාර්යයට උරදුන් සිංහල නරපතීන් අතර මහා පරාක්‍රමබාහුට හිමි වනුයේ සුවිශේෂ ස්ථානයකි. හෙතෙම සිය රාජ්‍යත්වයේ බලපරාක්‍රමය පතල අසිරිමත් සමය තුළ මහා පොළෝතලය අස්වැද්දුවේ කෙතින් ගොයමින් පමණක්ම නොව මලින් පලින් තුරුලියෙන් පිරී ගිය උයන්වතුවලින්මය. මහා පරාක්‍රමබාහු රජතොමෝ උද්‍යාන 29ක් කරවූ බව මහාවංසය සඳහන් කරයි.

> "නරෙන්ද්‍රතෙම නුවරවැස්සන්ට සර්වොපකරණයන් සුලභ කරවනු කැමැති වූයේ ඒ ඒ තැන්හි උයන්වතු කර වූයේය : ජනයන්ට සතුටු ඵලවන්නා වූ නරෙන්ද්‍රතෙම ඵල පුෂ්පධාරී වු නොයෙක් සියගණන් වෘක්ෂයෙන් සමලංකෘත වූ නන්දන නම් උයනක් කරවීය."[16]

> "රජතෙමෙ ඒ පුරයෙහි දිවාවිහරණ ඇත්තාවූ තමන් විසින් සතනයෙන් සම්භාවනා කටයුතු වූ සොභාවයෙන් බබලන්නාවූ දීප නම් උයෙනක, මහමෙව්නා නම් උයෙනක, එසේම චිත්‍රලතාවන නම් උයෙනක, මිශ්‍රක නම් උයෙනක, රාජනාරායණ නම් උයෙනක, ලංකාතිලක නම් උයෙනක, තිලොක නන්දන නම් උයෙනක, වානරාකර නම් උයෙනක, නයනුස්සව නම් උයෙනක, මනොහර නම් උයෙනක, නිම්මිතපුර නම් උයෙනක, ජය්‍ාසාහාර නම් උයෙනක, පූර්ණවර්ධන නම් උයෙනක, සංසාරඵල නම් උයෙනක, එසේම ඵාරසක නම් උයෙනක, සාලිපොත නම් උයෙනක, සොමනාථ නම් උයනෙක, ධානකොඨකණ නම් උයෙනක, උතුරුකුරු නම් උයෙනක, හරුකච්ඡ නම් උයෙනක, පුලචෙචරි නම් උයෙනක, කීළාකර නම් උයෙනක, පණ්ඩවාවන නම් උයෙනක, රාමෙශ්වර නම් උයෙනක, සාමිසනෙතාෂ නම් උයෙනක, එසේම චිත්තාමණී නම් උයෙනක, ප්‍රවුර නම් උයෙනක, යන මෙඋයන් කරවූයේය."[17]

මෙම උයන් අතුරින් නන්දන උයන සහ දීපෝද්‍යානය පොළොන්නරු නගර අභ්‍යන්තරයේ ම පිහිටි අතර මින් නන්දන උයන රජ මාළිගා අංගනයේ ම පිහිටි බව ද සඳහන් වේ. අතිශයින් ම අලංකාර වූ මෙම උයන් ඉතා චමත්කාරජනක දසුනක් වූ බව

සාහිත්‍යමය මූලාශ්‍ර හෙළි කරයි. රජුගේ පෞද්ගලික අවශ්‍යතාවලට මෙන් ම පොදු ජනතාවගේ අවශ්‍යතා පිණිස ද, මහා සංඝයා වෙනුවෙන් කළ උද්‍යාන ද මීට අයත් ය. මින් ලක්ෂෝද්‍යානය එක් එක් වර්ගයේ ගහකොළ ලක්ෂයක් බැගින් රෝපණය කොට නිමවන ලද්දකි.

> "එක ජාතියෙන් ලක්ෂය ලක්ෂය පමණ රෝපණය කරවා අර්ථානුගතවූ නම් ඇති බැවින් ලක්ඛුය්‍යානයයි සම්මත වූ මහ උයනක් බොහෝ උත්සාහ ඇත්තේ සාංගික කොට කරවූයේය. ග්‍රීස්ම කාලයෙහි භික්ෂුන්ට නහණු පිණිස ඒ උයනෙහි ගුහා ඇත්තා වූ සිත්කළු වූ ගල් පොකුණු දෙකක් කරවූයේය."[18]

මෙම උයන් අඹ, දඹ, දිවුල්, දොඩම් වැනි පළතුරු ද සපු, සල්, අශෝක, මූණමල්, ඉද්ද, බෝලිද්ද, බක් මී වැනි තුරුලතා ද, අරලු, බුලු, නෙල්ලි වැනි ඖෂධවලින් ද සමන්විත විය. මේවා විවිධ පක්ෂීන් ද, සතා සීපාවුන් ද අනෙකුත් උද්‍යාන අලංකරණ උපාංගවලින් ද යුක්ත විය. මහා පරාක්‍රමබාහු රජු සේ ම නිශ්ශංකමල්ල රජු ද පොළොන්නරු යුගයේ දී උද්‍යාන නිර්මාණයට දායක වී ඇත.

එසේ ම, 14 වන සියවසේ සිට රචනා වූ බොහෝ සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල ද ජල ක්‍රීඩා, ජල උද්‍යාන හා උද්‍යාන වැනුම් පිළිබඳ ව විස්තර වේ. කව්සිළුමිණ මින් ප්‍රධාන ය. එහි සඳහන් කෘත්‍රිම ජල තටාක, දොඹ අටල්ල, පොකුණු ආදී අංග ද, රජවරුන්ගේ උයන් කෙළි වර්ණනා ද ලංකාවේ උද්‍යාන කලාවක් පැවති බවටත්, මෙරට වැසියන් එයට දක්වූ සමීප සම්බන්ධතාවත් පෙන්නුම් කරයි. තව ද මෙම උයන් නිර්මාණය මහනුවර අවධියේ ද පැවතී ඇත. එසේ ම, II වන පරාක්‍රමබාහු රජ විසින් බෙන්තොට වෙහෙර සිට කලුගං තොට දක්වා ප්‍රදේශය පරාක්‍රමබාහු නමින් ප්‍රසිද්ධ කොට විශාල පොල් උයනක් කරවූ බව සඳහන් වේ.

> "ඉක්බිති රජ මහඇමති තෙමේ බෙන්තොට වෙහෙර පටන් කළු ගංතොට දක්වා යොදනක් පුළුල් තන්හි පරාක්‍රම[19]බාහු නමින් ප්‍රසිද්ධ කොට මනා සෙවනැති ඵලයෙන් හරිත වූ මහත් පොල් උයනක් කරවී."[19]

කෝට්ටේ යුගයේ රචනා වූ බොහෝ සංදේශ කාව්‍යයන් හි උයන් කෙළි පිළිබඳ අලංකාර වර්ණනා බහුල ය. යටත් විජිත අවධියේ දී, යටත් විජිත පාලකයන්ගේ දැඩි අවධානය ද උද්‍යාන අලංකරණය කෙරෙහි යොමු ව තිබිණ. ඒ බැව් වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන උද්භිද උද්‍යාන පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

මෙලෙසින් ශ්‍රී ලංකාවේ පැරණි උද්‍යාන කලාව පිළිබඳ ව අධ්‍යයනයෙහි ලා වැදගත් ම සාධකය වන්නේ සාහිත්‍යමය මූලාශ්‍ර වේ. ඒ අතරින් ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථ ද වැදගත් වේ. වෘක්ෂාර්වේද නම් වූ ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයෙහි රුක් රෝපණය, තාක්ෂණික භාවිතය, භූමි සැලසුම්කරණය, උද්‍යාන කළමනාකරණය සේ ම ඒවායෙහි මනා නඩත්තුව පිළිබඳ ව ද විස්තර කොට ඇත.[20] එසේ ම පුරාවිද්‍යාත්මක සහ සාම්ප්‍රදායික වාස්තු විද්‍යාව ඇසුරින් ද මෙම විෂය පිළිබඳ ව ඵලදායී අධ්‍යයනයක නියැලිය හැකි ය.

මහත් අපූර්වත්වයක් සේ ම විනෝදාස්වාදයක් ගෙන දෙන මෙම පැරණි කලාව මිනිසා ස්වභාවික පරිසරයට දක්වූ දැඩි රුචිකත්වය නිසා ම ඔහු අතින් නිම විය. කඳු, කැලෑ, දිය ඇලි, තෘණ භූමි, පොකුණු, මලින් පලින් පිරි පාරාදීසයක් බඳු මෙම සංකීර්ණ නිර්මාණය නිරන්තරයෙන් ම කෘත්‍රිම වුව, එමගින් හෙළි කරන වෘත්තාන්තය වනුයේ එය නිර්මාණය කළ මිනිසුන් අයත් සමාජයයි.

**ආන්තික සටහන්:**

1 බෙකට්, ෆ්‍රාන්සි, 1997, 44 පි.
2 මහාවංසය, 1 පරි, 21- 22 ගාථා.
3 මහාවංසය, 10 පරි, 85- 86 ගාථා.
4 දීපවංසය, 13 පරි, 18-22 ගාථා, 197 පි. මහාවංසය, 11 පරි, 1- 4 ගාථා.
5 මහාවංසය, 15 පරි, 57- 58, 73-75 ගාථා.
6 මහාවංසය, 15 පරි, 1- 5 ගාථා.
7 මහාබෝධිවංසය, 221 පි.
8 ගොඩකුඹුරේ, චාල්ස්.
9 **Epigraphia Zeylanica**, Vol. I, 29-36 p.
10 Bandaranayake, S. D., 1993, 32 p.
11 Bandaranayake, S. D., 1993, 32 p.
12 රිටිගල, 1999, 41 පි.

13 මාරසිංහ, වෝල්ටර්, 1993, xi පි.
14 මහාවංසය, 39 පරි, 9-10 ගාථා.
15 මහාවංසය, 42 පරි, 146 ගාථාව.
16 මහාවංසය, 79 පරි, 1-3 ගාථා.
17 මහාවංසය, 79 පරි, 6-14 ගාථා.
18 මහාවංසය, 79 පරි, 4-6 ගාථා.
19 මහාවංසය, 86 පරි, 44-46 ගාථා.
20 De Silva, Nimal, 1996, 64 p.


## ආශ්‍රිත ග්‍රන්ථ

1. මහාවංසය (1996), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු මුද්‍රණය, කොළඹ.
2. දීපවංසය (1970), කිරිඇල්ලේ ඥාණවිමල හිමි සංස්කරණය, කොළඹ.
3. මහාබෝධිවංසය (1970), නන්දසේන රත්නපාල සංස්කරණය, කොළඹ.
4. කව්සිළුමින (1966), වැලිවිට සෝරත හිමි සංස්කරණය, කොළඹ.
5. ජගන්නාථ, ප්‍රතාප් (1929)" උපවන විනෝදය, බරණැස.
6. පරණවිතාන, එස් (1972), පුරාවිද්‍යා පර්යේෂණ, කොළඹ.
7. ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය (1972), I කාණ්ඩය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පැලියගොඩ.
8. රිටිගල (1999), උදිත ප්‍රසන්න අලහකෝන් පරිවර්තනය, මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ.
9. මාරසිංහ, වෝල්ටර් (1993),මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ.
10. බෙකට්, ෆ්‍රාන්සි (1997), යුනෙස්කෝ කුරියර්, කොළඹ.
11. **Archaeological Survey Reports**"*Kaludiya Pokuna Ruins"* (1911-12), Department of Archaeology, Colombo.
12. Bandaranayake, S. D. (1993),*"The Royal and Monastic Gardens at Sigiriya and Anuradhapura,"* **ICOMOS** Publications.
13. Bandaranayake, S. D. (1974), **Sinhalese Monastic Architecture**, Leiden.
14. De Silva, Nimal (1996),"*Concepts and Principles in Traditional Landscape Architecture",* **SLIA Journal**, Colombo.
15. De Silva, Nimal (1996) , **Landscape Tradition of Sri Laka**, Colombo.
16. De Silva, Roland (1972) ,*"Lessons of Town Planning from Ancient Ceylon,"***SLIA Journal**, Colombo.
17. **Epigraphia Zeylanica** (1912) , Oxford University Press, London.
18. Godakumbure, C. E."*Sinhalese Festivels - Water Garden and Sports,"***JRASCB**, Vol. XIV.